# කැළණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)- 2013

2016 - ඔක්තෝබර්

**BCOME 4554** - කාර්මික නීතිය

ප්‍රශ්න සංඛ්‍යාව : (හතයි) 07 කාලය : පැය 03 යි

ප්‍රශ්නය පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. අ. "කාර්මික ආරවුලක් යනු " කුමක්ද යන්න විනිශ්චිත නඩු තීන්දු යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. " සේවායෝජකයන් විසින් වෘත්තිය සමිති පිළිගැනීම සහ සේවායෝජකයන් විසින් සේවකයන් සම්බන්ධයෙන් අනුගමනය කරන ඇතැම් ක්‍රියාමාර්ග "අසාධාරණ " නිශ්චය කිරිම පිණිස 1999 දී 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත සංශෝධනය කරන ලදී. "

i. " වෘත්තිය සමිති පිළිගැනීම " වශයෙන් ඔබ අදහස් කරනුයේ කුමක්ද ?

ii. සංශෝධිත පනත මගින් අසාධාරණ යයි දක්වා ඇති කම්කරු ක්‍රියා මාර්ග මොනවාද ?

(ලකුණු 10)

02. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සහ සේවක අර්ථසාධක අරමුදල අතර ඇති සමාන අසමානකම් දක්වන්න.

(ලකුණු 20)

03. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ විධිවිධාන වලට අනුව සේවකයන් වෙත පාරිතෝෂික ගෙවීම පිළිබඳව සේවා යොජකයෙකු සතු වගකීමේ ස්වභාවය සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

04. අ. වෘත්තීය සමිතියක් ආරම්භ කිරීමේ අරමුණු මොනවාදැයි, වෘත්තිය සමිති ආඥා පනත කෙරෙහි අවධානය යොමු කරමින් දක්වන්න.

(ලකුණු 10)

ආ. රජයේ සේවකයන්ගේ වෘත්තිය සමිති ලියාපදිංචි කිරීම පිළිබඳව බලපාන්නාවූ විශේෂ සීමා කිරීම් මොනවාද ?

(ලකුණු 10)

05. අ. වැටුප් ගෙවීම සහ වාර්තා නඩත්තු කිරීම පිළිබඳව 1941 අංක 17 දරන පඩිපාලක සභා ආඥා පනතේ සඳහන් විධිවිධාන මොනවාදැයි විස්තර කරන්න.

(ලකුණු 10)

ආ. පඩිපාලක සභාවක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් අදාල පනතේ දක්වා ඇති විධිවිධාන කවරේද ?

(ලකුණු 10)

06. පහත සඳහන් දෑ පිළිබඳව අවධානය යොමු කරමින් 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත පිළිබඳ සටහනක් ලියන්න.

අ. වැඩ කරන කාලසීමාව

ආ. පොදු නිවාඩු

ඇ. වාර්ෂික නිවාඩු

ඉ. අනියම් නිවාඩු

ඊ. පත්වීමේ ලිපිය

(ලකුණු 20)

07. ශ්‍රී ලංකාවේ ඇති විවිධ වූ රැකියා ගිවිසුම් මොනවාදැයි නම් කොට සුදුසු උදාහරණ සහිතව ඒවා පැහැදිලි කරන්න.

(ලකුණු 20)